# ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය

# කාර්ය මණ්ඩල පුරප්පාඩු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින්, ජාතික නෛතික අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පරිචයන් (SARPs) හට අනුකූල වන ආරක්ෂිත, ප්‍රවේශම් සහිත, කාර්යක්ෂම හා පරිසර හිතකාමී ජාතික සිවිල් ගුවන් සේවා පද්ධතියක්, මනාලෙස ස්ථාපිත නියාමන කාර්ය රාමුවක් යටතේ උපායමාර්ගික සැලසුම්කරණය, වෘත්තීය මාර්ගෝපදේශ හා දැඩි ආවේක්ෂණය තුළින් සහතික කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් පහත සඳහන් තනතුරු පිරවීම සඳහා කාර්යක්ෂම, උද්යෝගිමත් හා ස්වයං – අභිප්‍රේරිත සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයෙහි ඉතා ඉහළ සුදුසුකම් හා දීර්ඝ පළපුරුද්ද සහිත අයවලුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (ඒකාබද්ධ කළමනාකරණ)

**තනතුරු කේතය : HM-2-1-DDG3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 2-1) - රුපියල් 91,645-12X2,700-124,045/- - MS චක්‍රලේඛ 02/2016 (I) ප්‍රකාරව

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප, දළ වශයෙන් රුපියල් 184,945.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- ඉන්ධන දීමනාව, මාසිකව ලීටර් 135 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවත්නා මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, කළමනාකරණ, වාණිජ්‍ය හෝ පරිපාලන ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සහ

2. ආර්ථික විද්‍යා, ගණකාධිකරණ, කළමනාකරණ වාණිජ්‍ය, පරිපාලන ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) හෝ මූල්‍ය කළමනාකරණ හෝ පරිපාලන ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ ප්‍රසිද්ධ පෞද්ගලික ආතතයක කළමනාකරණ තලයේ මූල්‍ය, කළමනාකරණ, පරිපාලක හෝ විගණන ක්ෂේත්‍රයේ අවම වසර දහඅටක (18) සේවා පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් (විකල්ප 01 හෝ විකල්ප 02)**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. CAASL ආයතනයේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා දේපළ කළමනාකරණ) තනතුරක හෝ අධ්‍යක්ෂ (මූල්‍ය හා ආදයම් කළමනාකරණ) තනතුරක හෝ අධ්‍යක්ෂ (තත්ත්ව හා අභ්‍යන්තර විගණන) තනතුරක අවම වසර පහක (05) සේවා පළපුරුද්ද

සහ

2. පූර්ව වසර පහක තිකැළැල් සේවා වාර්තාවක් සතුවීම හා වර්තමාන තනතුරෙහි සියලු වැටුප් වර්ධක ලබා ගෙන තිබීම,

සහ

3. වාර්ෂික කාර්යසාධනය සම්බන්ධයෙන් "හොඳයි" හෝ ඉහළ ශ්‍රේණිගත කිරීමක් ලබා තිබීම.

සහ

4. බහු විෂයයන්ගෙන් සමන්විත කණ්ඩායම් හට මග පෙන්වීමේ හා දිශානති කිරීමේ සනාථ කළ හැකියාව, මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂම කළමනාකරණයේ හා නියමානුකූල සංවර්ධනයේ සනාථ කළ හැකියාව.

## අධ්‍යක්ෂක (පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර)

**තනතුරු කේතය : HM-1-1-D5 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 1-1) - රුපියල් 80,295-15X2,270-114,345/- - MS චක්‍රලේඛ 02/2016 (i) ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප, දළ වශයෙන් රුපියල් 170,595.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- මාසික ඉන්ධන දීමනාව, ලීටර් 115 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ස්වභාවික විද්‍යාව, ගුවන් ප්‍රවාහන, ගගනිත තල හෝ ගුවන් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සමග

2. ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි (Masters) සුදුසුකම් හෝ ගුවන් සේවා පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද ගුවන් ගමන් සුරක්ෂිතතාව / පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයේ සති හයක (06) නොඅඩු කාලයක පාඨමාලාවක් (කළමනාකරණ මට්ටමේ) සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් ප්‍රසිද්ධ පෞද්ගලික ආතතයක වාණිජ නියමුවකු, පියසර පිටත්කරන්නකු, ගුවන්යානා නඩත්තු ඉංජිනේරු හෝ ගුවන් ගමන් පාලන ක්ෂේත්‍රයේ පූර්ණ වරප්‍රසාද සහිත ගුවන් ගමන් පාලක ලෙස අවම වසර දහයක (10) පළපුරුද්ද

**විකල්ප - 2**

1. ගුවන් සේවා හා සම්බන්ධ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද සුරක්ෂිතතාව ඇතුළත්, පුද්ගල බලපත්‍ර/ පුද්ගල බලපත්‍ර පරීක්ෂක පාඨමාලාව (කළමනාකරණ මට්ටම), (සති හයකට (06) නොඅඩු කාලයක) සාර්ථකව සම්පූර්ණ කර තිබීම, හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වාණිජ නියමුවකු, පූර්ණ වරප්‍රසාද සහිත ගුවන් ගමන් පාලකයකු හෝ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු, පියසර පිටත් කරන්නකු ලෙස අවම වසර පහළොවක (15) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 2**

1. පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරනයේ (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

සහ

2. පසුගිය වසර පහ (05) තුළ තිකැළැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබිය යුතු අතර, වර්තමාන තනතුරට අදාළව සියලුම වැටුප් වර්ධකයක් ලබාගත යුතුය.

සහ

3. අධිකාරිය විසින් අනුමත, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ එහි පිළිගත් ආයතනයක් විසින් පවත්වනලද පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයේ සති හයකට (06) නොඅඩු කාලයක උසස් පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

සහ

4. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්යසාධනයේ ඇගයුම් සඳහා "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තබිය යුතුය.

## අධ්‍යක්ෂ (ගුවන් යානා මෙහෙයුම්)

**තනතුරු කේතය : HM-1-1-D6 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 1-1) - රුපියල් 80,295-15X2,270-114,345/- - MS චක්‍රලේඛ 02/2016 (I) ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 170,595.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම් රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- මාසිකව ඉන්ධන දීමනාව ලීටර් 115 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින මිල ගණන් ප්‍රකාරව)
- මේ සඳහා අවශ්‍ය සුදුසුකම් සතු සාර්ථක අයදුම්කරු හට දළ වශයෙන් රුපියල් 260,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 1**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, ස්වභාවික විද්‍යාව, ගුවන් ප්‍රවාහනය, ගගනතල හෝ ගුවන් ඉංජිනේරු ක්ෂේත්‍රයේ වසර තුනකට (03) නොඅඩු ප්‍රථම උපාධියක්

සමග

2. ගුවන් සේවා ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධි (Masters) සුදුසුකමක් හෝ ගුවන් සේවා පිළිබඳ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද ගුවන් ගමන් සුරක්ෂිතතාව/ ගුවන් යානා මෙහෙයුම් පිළිබඳ සති හයකට (06) නොඅඩු කාලයක පුහුණු පාඨමාලා මාලාවක් කළමනාකරණ මට්ටමේ සම්පූර්ණකර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක වාණිජ නියමුවකු හෝ පියසර පිටත් කරන්නකු ලෙස කළමනාකරණ මට්ටමේ අවම වසර දහයක (10) පළපුරුද්ද.

**විකල්ප - 2**

1. ගුවන්සේවා සම්බන්ධ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක පූර්ණ සාමාජිකත්වය හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ ජාත්‍යන්තරව පිළිගත් සමාන මට්ටමේ සංවිධානයක් විසින් පවත්වන ලද සුරක්ෂිතතා පරීක්ෂණ/ ගුවන් යානා මෙහෙයුම් ඇතුළත්, සති හයකට (06) නොඅඩු ගුවන්යානා මෙහෙයුම් පුහුණු පාඨමාලාවක් (කළමනාකරණ මට්ටමේ) සාර්ථකව සම්පූර්ණ තර තිබීම හෝ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් පිළිගත් සමාන මට්ටමේ ඕනෑම සුදුසුකමක්

සහ

2. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක/ රජය සතු සමාගමක හෝ පිළිගත් ආයතනයක වාණිජ ගුවන් නියමුවක හෝ පියාසර පිටත්කරන්නෙකු ලෙස අවම වසර විස්සක (20) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 1**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම

**විකල්ප - 2**

1. ගුවන් යානා මෙහෙයුම් ක්ෂේත්‍රයේ කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

සහ

2. පසුගිය වසර පහ (05) තුළ තිකැළැල් සේවා වර්තාවක් පවත්වාගෙන තිබිය යුතු අතර, වර්තමාන තනතුරට අදාළව සියලුම වැටුප් වර්ධකයන් ලබාගෙන තිබිය යුතුය.

සහ

3. අධිකාරිය විසින් අනුමත, ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය හෝ එහි පිළිගත් ආයතනයක් විසින් පවත්වනලද සුරක්ෂිතතා පරීක්ෂක මෙහෙයුම් පාඨමාලාව ඇතුළත් ගුවන්යානා පියාසර මෙහෙයුම් සහ ගුවන් සේවා බිම් මෙහෙයුම් ක්ෂේත්‍රයේ සති හයකට (06) නොඅඩු උසස් පුහුණු පාඨමාලාවක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

සහ

4. පසුගිය වසර පහ (05) සඳහා වාර්ෂික කාර්ය සාධනයේ ඇගයුම් සඳහා "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තබිය යුතුය.

## අධ්‍යක්ෂ (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ)

**තනතුරු කේතය : HM-1-1-D12 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (HM 1-1) - රුපියල් 80,295-15X2,270-114,345/- - MS චක්‍රලේඛ 02/2016 (I) ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප, දළ වශයෙන් රුපියල් 173,595.00 වේ. (තමන්ගේම වාහනයක් භාවිතා කරන්නේ නම්. රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව ඇතුළුව)
- මාසිකව ඉන්ධන දීමනාව ලීටර් 115 වටිනාකමට ගෙවනු ලැබේ. (එම අවස්ථාවේ පවතින මිල ගණන් ප්‍රකාරව)
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

සහ

2. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (Masters) සුදුසුකමක්

සහ

3. සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ, කළමනාකරණ මට්ටමේ, අවම වසර දහතුනක (13) පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ, කළමනාකරු වර්ගීකරණයේ (MM 1-1) 1 ශ්‍රේණිය තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

## ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් කළමනාකරණ - තාක්ෂණ)

**තනතුරු කේතය : MM-1-1-AN3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MM-1-1 1) - රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප, දළ වශයෙන් රුපියල් 143,475.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන්හට දළ වශයෙන් රුපියල් 170,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාව හිමිවේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 01**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරකට (04) නොඅඩු කාලයක විදුලි සංදේශ/ ගුවන් තාක්ෂණ ඉල්ලෙක්ට්‍රොනික ශිල්පීය ක්‍රම ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සමග ගුවන් සංතරන සේවා සහ බිම් සහයක සේවා නිරත රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක, සුදුසුකම් ලැබීමෙන් පසුව ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ/ ගුවන් තාක්ෂණ ඉල්ලෙක්ට්‍රොනික ශිල්පීය ක්‍රම ඉංජිනේරුවරයෙකු ලෙස වසර අටකට (08) නොඅඩු පළපුරුද්දක් තිබීම.

**විකල්ප - 02**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත්වීම සමග, ගුවන් සංතරන සේවා සහ බිම් සහයක සේවා නිරත රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ සංවිධානයක, ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ/ ගුවන් තාක්ෂණ ඉල්ලෙක්ට්‍රොනික ශිල්පීය ක්‍රම ඉංජිනේරු ලෙස අවම වසර අටක (8) පළපුරුද්ද

**විකල්ප - 03**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 තලයට නොඅඩු, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම සමග ගුවන් සංතරණ සේවා හා භූමි සහායක සේවාවල නිරත රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ/ ගුවන් තාක්ෂණ ඉල්ලෙක්ට්‍රොනික ශිල්පීය ක්‍රම ඉංජිනේරු ලෙස අවම වසර අටක (08) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

අදාළ බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

1. සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් සංචරණ කළමනාකරණ - තාක්ෂණික) ලෙස අවම වසර හයක (06) සේවා පළපුරුද්ද

සහ

2. පසුගිය වසර හය (06) තුළ තිකැළැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම හා වර්තමාන තනතුරට අදාළව සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම

සහ

3. ගුවන් ගමන් කළමනාකරණ ක්ෂේත්‍රයේ, අවම සති හතරකට (04) නොඅඩු කාලයක් ICAO අනුමත කළ පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම.

සහ

4. වාර්ෂික කාර්යසාධන ඇගැයුම්වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් මෙහෙයුම්කරුවන් සහතික කිරීම් සහ ප්‍රවීක්ෂණ)

**තනතුරු කේතය : MM-1-1-AW3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MM-1-1) - රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප, දළ වශයෙන් රුපියල් 143,475.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන්හට දළ වශයෙන් රුපියල් 270,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාව හිමිවේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 01**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරකට (04) නොඅඩු කාලයක යාන්ත්‍රික, විද්යුත් හෝ ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ ප්‍රථම ඉංජිනේරු උපාධියක් සමග ගුවන් සේවා හි නියුක්ත රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ පිළිගත් වෙළඳ ආයතනයක, ගුවන් කරන යෝග්‍යතා පරීක්ෂක/ ඉංජිනේරු හෝ ගුවන් යානා නඩත්තු ඉංජිනේරු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු වසර අටකට (08) නොඅඩු පළපුරුද්ද.

**විකල්ප - 02**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත්වීම හෝ සමාන සුදුසුකම් සමග වාණිජ ගුවන් සේවා, යානා නඩත්තුව හෝ අලුත්වැඩියා කිරීම හෝ පියාසර පුහුණු හෝ ඉජිනේරු පුහුණු හි නිරත රාජ්‍ය හෝ පුද්ගලික සංවිධානයක, යාන්ත්‍රික, විද්යුත් හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු වරයෙකු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටක (08) පළපුරුද්ද

**විකල්ප - 03**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 7 තලයට නොඅඩු, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම හෝ ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රයක් (AML) තිබීම සමග වාණිජ ගුවන් සේවා, ගුවන් යානා නඩත්තුව හෝ අලුත් වැඩියාව හෝ පියසර පුහුණු හෝ ඉජිනේරු පුහුණු හි නිරත රාජ්‍ය හෝ පුද්ගලික සංවිධානයක, යාන්ත්‍රික, විද්යුත් හෝ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවරයෙකු ලෙස සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටක(08) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

1. අදාළවනපරිදි සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් කරන යෝග්‍යතා - Airframe) සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් කරන යෝග්‍යතා - බල යන්ත්‍රාගාර) සිවිල් ගුවන් සේවා පරීක්ෂක (ගුවන් කරන යෝග්‍යතා -ඒවියෝනික) සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් කරන යෝග්‍යතා - සැලසුම් හා නිෂ්පාදන) තනතුරක අවම වසර හයක (06) සේවා පළපුරුද්ද

සහ

2. පසුගිය වසර හය (06) සඳහා නිකැළැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම හා වර්තමාන තනතුර සඳහා වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම

සහ

3. ගුවන් කරන යෝග්‍යතා ක්ෂේත්‍රයෙහි සති හතරක (04) කාලයකට නොඅඩු ICAO අනුමත කළ පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම

සහ

4. වාර්ෂික කාර්යසාධන ඇගැයුම් වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

## ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර නොවන කාර්ය මණ්ඩලය)

**තනතුරු කේතය : MM-1-1-PL4 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MM 1-1) - රුපියල් 53,175-10X1,375-15X1,910-95,575/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව

- සියලු දීමනා ඇතුළත් මාසික වැටුප දළ වශයෙන් රු. 143,475.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුහට, දළ වශයෙන් රුපියල් 85,000.00 ක විශේෂ තාක්ෂණ දීමනාවක් හිමිවේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 01**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, වසර තුනකට (03) නොඅඩු කාලයක භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගණ තල, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හෝ ඉංජිනේරු ධාරාවේ ප්‍රථම උපාධියක් සමග ගුවන් සේවා හි නියුක්ත රජයේ දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු අවම වසර අටකට (08) නොඅඩු පළපුරුද්ද

**විකල්ප - 02**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, අන්තර් මධ්‍ය විභාගය සමත්වීම සමග ගුවන් සේවාහි නිරත රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වසර අටක (08) පළපුරුද්ද

**විකල්ප - 03**

තෘතියක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ, ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් (NVQ) 7 තලයට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනතා සහතිකයක් ලබාතිබීම සමග ගුවන් සේවා හි නියුතු රාජ්‍ය දෙපාර්තමේන්තුවක/ රාජ්‍ය ව්‍යවසායක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ විධායක තනතුරක සුදුසුකම් ලැබීමෙන් පසු, අවම වසර අටක (08) පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

**විකල්ප - 01**

ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.

**විකල්ප - 02**

1. අදාළවනපරිදි, සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - විභාග), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර -ප්‍රමිතීන්), සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කාර්ය මණ්ඩලය), සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර නොවන කාර්ය මණ්ඩලය) සිවිල් ගුවන් සේවා පරීක්ෂක (පියාසර පුහුණු) තනතුරක අවම වශයෙන් වසර හයක (06) සේවා පළපුරුද්ද

සහ

2. පසුගිය වසර හය (06) සඳහා නිකැළැල් සේවා වාර්තාවක් පවත්වාගෙන තිබීම හා වර්තමාන තනතුර සඳහා වන සියලුම වැටුප් වර්ධක ලබාගෙන තිබීම

සහ

3. පුද්ගල බලපත්‍ර ක්ෂේත්‍රයෙහි සති හතරක (04) කාලයකට නොඅඩු ICAO අනුමත කළ පුහුණු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කොට තිබීම

සහ

4. වාර්ෂික කාර්ය සාධන ඇගැයුම්වලදී "හොඳයි" හෝ ඉන් ඉහළ ශ්‍රේණියක් ලබා තිබීම.

**සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යානා කුටි සුරක්ෂිතතා)**
**තනතුරු කේතය : MA-5-3-OP3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රුපියල් 46,375-10X1,135-20X1,240-82,525/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව මාසික වේතනය දළ වශයෙන් රුපියල් 110,875.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරු හට, දළ වශයෙන් රු. 25,000.00 ක විශේෂ තාක්‍ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

1. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය මගින් පිළිගත් කුටි කාර්ය මණ්ඩල සහතිකය (Cabin Crew Certificate)

සහ

2. ජාත්‍යන්තර ගුවන්සේවා මෙහෙයුම්හි නිරත වාණිජ ගුවන් සේවාවක කුටි කාර්යමණ්ඩලය සාමාජිකයකු ලෙස අවම වසර පහක (05) පළපුරුද්ද.

සහ

3. ජාත්‍යන්තර ගුවන් සේවා මෙහෙයුම්හි නිරත වාණිජ ගුවන් සේවාවක පර්සර්වරයෙකු (Purser) ලෙස අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද.

**සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යානා බිම් මෙහෙයුම්)**
**තනතුරු කේතය : MA-5-3-OP2 තනතුරු ගණන - 02**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රුපියල් 46,375-10X1,135-20X1,240-82,525/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව මාසික වැටුප දළ වශයෙන් රුපියල් 110,875.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන්හට, දළ වශයෙන් රු. 25,000.00 ක විශේෂ තාක්‍ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- අධිකාරිය විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගණ කර්මාන්ත, තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය හෝ ඉංජිනේරු ධාරාවේ වසර තුනකට (03) නොඅඩු කාලයක විද්‍යා ප්‍රථම උපාධියක් සමග එක් (01) අවුරුදු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

**සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - විභාග)**
**තනතුරු කේතය : MA-5-3-PL1 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රුපියල් 46,375-10X1,135-20X1,240-82,525/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව මාසික වේතනය දළ වශයෙන් රුපියල් 110,875.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුහට, දළ වශයෙන් රුපියල් 40,000.00 ක විශේෂ තාක්‍ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගණ කර්මාන්ත, තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණය හෝ ඉංජිනේරු ධාරාවේ වසර තුනකට (03) නොඅඩු කාලයක විද්‍යා ප්‍රථම උපාධියක් සමග එක් (01) අවුරුදු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත ක්ෂේත්‍රයෙහි පශ්චාත් උපාධිය ඩිප්ලෝමාවක්

**සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණ - මෙහෙයුම්)**
**තනතුරු කේතය : MA-5-3-AN1 තනතුරු ගණන - 01**

**සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණ - ප්‍රමිති හා ක්‍රියාපටිපාටි)**
**තනතුරු කේතය : MA-5-3-AN4 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රුපියල් 46,375-10X1,135-20X1,240-82,525/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව මාසික වේතනය දළ වශයෙන් රුපියල් 110,875.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන් හට, දළ වශයෙන් රු. 130,000.00 ක විශේෂ තාක්‍ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- අධිකාරිය විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් :**

**විකල්ප - 01**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, භෞතික විද්‍යාව, ප්‍රවාහනය, ගගණ කර්මාන්ත, තොරතුරු තාක්ෂණ හෝ ඉංජිනේරු ධාරාවේ වසර තුනකට (03) නොඅඩු කාලයක විද්‍යා ප්‍රථම උපාධියක් සමග එක් (01) අවුරුදු විධායක ශ්‍රේණියේ පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ඉහත ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්

**විකල්ප - 02**

රේඩාර් ගුවන් ගමන් පාලක වරයකු ලෙස රේඩාර් ශ්‍රේණිගත කිරීම් සහිතව වසර දහයකට (10) නොඅඩු පළපුරුද්ද.

**සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණ - තාක්ෂණික)**
**තනතුරු කේතය : MA-5-3-AN3 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (MA 5-3) - රුපියල් 46,375-10X1,135-20X1,240-82,525/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව මාසික වේතනය දළ වශයෙන් රුපියල් 110,875.00
- අවශ්‍ය සුදුසුකම් සහිත සාර්ථක අයදුම්කරුවන් හට, දළ වශයෙන් රු. 130,000.00 ක විශේෂ තාක්‍ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විදුලි සංදේශ ධාරාවේ වසර හතරකට (04) නොඅඩු කාලයක ඉංජිනේරු ප්‍රථම උපාධියක් සමග එක් අවුරුදු (01) විධායක ශ්‍රේණියේ පළපුරුද්ද හෝ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින්, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්.

**සභාපතිවරයා සඳහා පුද්ගලික සහකාර**
**තනතුරු කේතය : JM-1-1-DM1 තනතුරු ගණන - 01**

**ලබාදෙනු ලබන වේතනය :** (වැටුප් පරිමාණය (JM 1-1) - රුපියල් 42,600-10X755-18X1,135-70,580/- MS චක්‍රලේඛ 02/2016 ප්‍රකාරව)

- සියලු දීමනා ඇතුළත්ව මාසික වේතනය දළ වශයෙන් රුපියල් 107,100.00
- CAASL විසින් අනුමත වෙනත් ප්‍රතිලාභ.

**සුදුසුකම් හා පළපුරුද්ද :**

| **බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)** | **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)** |
|---|---|
| 1. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ ක්ෂේත්‍රයක උපාධියක්.<br>2. තනතුරට අදාළ ක්ෂේත්‍රයක ඩිප්ලෝමාවක්/ උසස් ඩිප්ලෝමාවක් (පාඨමාලා කාලය වසර එකකට (01) නොඅඩු විය යුතුය) ලබාගෙන තිබීම සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයක වසර පහක (05) පළපුරුද්ද | 1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අපේක්ෂිත සුදුසුකම් ලබා තිබීම.<br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක 'කළමනාකාර සහකාර - තාක්ෂණ නොවන' වර්ගීකරණයේ (MA1)II ශ්‍රේණියේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

| **වයස් සීමාව** | | |
|---|---|---|
| **තනතුර** | **වයස් සීමාව** | **සටහන** |
| නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්/ අධ්‍යක්‍ෂ | අවුරුදු 35-55 | මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ. දේශීය ගුවන් සේවා හා පියාසර පාසල්වල අයදුම්කරුවන් හට අදාළ නැත. |
| ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්‍ෂක/ සිවිල් ගුවන් සේවා පරීක්ෂක | අවුරුදු 22-45 | |
| අධ්‍යක්‍ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ) | අවුරුදු 35-55 | අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ |
| සභාපතිවරයා සඳහා පුද්ගලික සහකාර | අවුරුදු 22-45 | අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ. |

- වැඩිදුර විස්තර, රැකියා විස්තරය, විශේෂ තාක්‍ෂණ දීමනාව සඳහා අවශ්‍ය සුදුසුකම් හා **සම්මත අයදුම්පත්‍ර ආකෘතින්** CAASL ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.caa.lk වෙතින් බාගත කළ හැක.
- යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025-02-24 දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් employment@caa.lk විද්‍යුත් තැපැල මගින් පමණක් එවිය යුතු අතර, විද්‍යුත් ලිපියෙහි ශීර්ෂ තීරුවෙහි අයදුම්කරනු ලබන තනතුර/තනතුරු අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය. සියලුම අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු ලැබේ.
- අයදුම්කරුවන් විසින්, අයදුම්කරනු ලබන තනතුර/තනතුරු සඳහා වන සුදුසුකම් තහවුරු කරනු පිණිස සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.
- **අදාළ සම්මත අයදුම්පත්‍ර ආකෘතිවලින්** යොමු කරනු ලබන අයදුම්පත් පමණක් භාරගනු ලැබේ. රාජ්‍ය ආයතන වල අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.
- තනතුරු කිහිපයකට අයදුම්කරන්නේ නම් එක් එක් තනතුරක් සඳහා වෙන් වශයෙන් අයදුම්පත් එවිය යුතුය.
- සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්‍ෂණ/ විභාග සඳහා කැඳවනු ලබයි.

**සිවිල් ගුවන්සේවා අධ්‍යක්‍ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රීලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය,**
**අංක 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක.**

**2025-02-09**